

## ලෝක රඟමඬලේ එකට රඟ පෑම : ප්‍රසාංගික කලාව සහ නිර්මාණාත්මක ක්‍රම තුළින් ගැටුම් පරිවර්තනය

සංවිධායක මණ්ඩලයට මෙම වැඩසටහන විකාශනය කිරීමට පෙර නරඹන්නන් හට පහත ප්‍රකාශය ලබා දිය හැක:

සාදරයෙන් පිළිගනිමු

'ලෝක රඟමඬලේ එකට රඟ පෑම' නම් වාර්තාමය චිත්‍රපටය ප්‍රසාංගික කලාව සහ නිර්මාණාත්මක ක්‍රම තුළින් ගැටුම් පරිවර්තනය පිළිබඳ චිත්‍රපටයකි. අරගල වලදී බලය අනිසි ලෙස භාවිත වන විට සාමය ගොඩනැගීමේ ප්‍රසාංගික කලාව තුළින් අවිහිංසා වාදීව එයට මුහුණ දුන් අවස්ථා, ප්‍රති විරෝධීන්ට එකිනෙකා දෙස මනුෂ්‍ය වාදීව බැලීමට සැලැස්වූ අවස්ථා සහ යුද්ධයෙන් පීඩාවට පත් වූවන් ප්‍රසාංගික කලාව තුළින් සහජීවනය ළඟා කර ගත් අවස්ථා මෙම වාර්තාමය චිත්‍රපටයෙන් වඩාත් ඉස්මතු කරවයි.

ලොව පුරා විවිධ ප්‍රජාවන් සමඟ එක්ව ක්‍රියා කරන රංගන ශිල්පීන්, ප්‍රජාවිධි සහ චාරිත්‍ර කරුවන් සහ ගැටුම් නිරාකරණ විශේෂඥයින් අතර ඇතිවූ සුවිශේෂී සංවාදයක ප්‍රතිඵලයක් ලෙස මල් ඵල ගැන්වුනු මෙම වාර්තාමය චිත්‍රපටය, බ්‍රැන්ඩයිස් විශ්ව විද්‍යාලයේ කලාව සහ සාමය ගොඩනැගීමේ වැඩසටහන (Peacebuilding and the Arts at Brandeis University) සහ Theatre Without Borders වැඩසටහන අතර සමූහ දායකත්වය කි. මෙම වාර්තාමය චිත්‍රපටය පිළිබඳව අදහස් දැක්වීමට අපි ඔබට කාරුණිකව ආරාධනා කර සිටිමු. ඔබ කලාකරුවෙකු, ක්‍රියාධරයෙකු, විද්‍යාර්ථයෙකු, ප්‍රතිපත්ති සම්පාදකයෙකු, ආධුනිකයෙකු හෝ අත්දැකීම් බහුල වෘත්තිකයෙකු වුව මෙම වැඩසටහන ඔබට කිසියම් පණිවිඩයක්, අභියෝගයක් හෝ අනුබලයක් ලබා දෙනු ඇතැයි අපි සිතමු. එමෙන්ම මෙම වැඩසටහන මගින් ඔබගේ පරිකල්පනය අවදිකර ප්‍රසාංගික කලාව තුළින් සහජීවනය ඇති කර ගන්නා සාමූහික ක්‍රියාවලියක් කරා ඔබ රැගෙන යනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු.

www.theatrewithoutborders.com මෙම වෙබ් අඩවිය ඔස්සේ ඔබට ලොව පුරා විසිරී සිටින කලාකරුවන් සමඟ සම්බන්ධ වීමේ හැකියාව ඇත. ඉහත කී වෙබ් අඩවිය ඔස්සේ ඔබට මෙම වාර්තාමය චිත්‍රපටයට දායක වූ ශිල්පීන්, වෙනත් කලාකරුවන් පිළිබඳවත් සාමය ගොඩනැගීමේ ප්‍රසාංගික කලාව පිළිබඳවත් දැන ගැනීමට හැකියාව ඇත. www.actingtogether.org මෙම වෙබ් අඩවිය ඔස්සේ අපගේ නිර්මාණ වලට අදාල පොත්පත් සහ සාමය ගොඩනැගීමේ ප්‍රසාංගික කලාවට විශේෂිත වූ මෙවලම් මෙන්ම වෙනත් සම්පත් පිළිබඳවද විස්තර ලබාගත හැක. එමෙන්ම එහිදී ඔබට අපගේ කලාව සහ සාමය ගොඩනැගීම පිළිබඳ පුවත් පත්‍රිකාව ගෙන්වා ගැනීම සඳහාද ලියාපදිංචි විය හැක.

මෙම වාර්තාමය චිත්‍රපටය පරිවර්තනය කිරීමට නිර්ලෝභී දායකත්වය දැක්වූ එලේන් රූබන් (ආදි ශිෂ්‍යාව - බ්‍රැන්ඩයිස් විශ්ව විද්‍යාලයල - 1963 වසර) ප්‍රවීණ ලාංකීය කලාකරු ධර්මසිරි බණ්ඩාරනායක සහ ආනන්ද වක්කුඹුර යන මහත්ම මහත්මීන් ට අපගේ බලවත් කෘතඥතාවය.

අපගේ මෙම වාර්තාමය චිත්‍රපටය නරඹා සංවාදයට එක් වූ ඔබ සැමට අපගේ ප්‍රණාමය

තාක්ෂණික තොරතුරු - වැඩසටහන නැරඹීමේදී පරිඝනකය භාවිතය.

DVD drive (8X or faster preferred)
Mac OSX or Windows XP/Vista/7 operating system (earlier versions untested)
1GHz processor (or higher)
Video card and adequate RAM

මෙම වැඩසටහන නැරඹීමට පෙර අනෙකුත් සියළුම ලිපි ගොනු වසා දමන්න. මෙම වී.සී.ඩී. තැටිය ඩී.වී.ඩී. යන්ත්‍රයක හෝ පරිඝනකයක නැරඹිය හැක. මෙම වැඩසටහන පිරිසක් ඉදිරියේ දර්ශනගත කරන්නේ නම්, ඩී.වී.ඩී. යන්ත්‍රයට හෝ පරිඝනකයට සම්ප්‍රේශකයක් සම්බන්ධ කිරීමේ හැකියාව ඇත. තිරය අඳුරුව ඇති විට වැඩසටහනේ ආරම්භක වාදනය ඇරඹෙන බව කරුණාවෙන් සලකන්න.